10
පාඩම
दशमः पाठः

# इदम्, किम् ශබ්ද ප්‍රථමා විභක්ති පද

## 10.1 ක්‍රියාකාරකම

इदम्, किम् පුරුෂලිංග ශබ්දවල ප්‍රථමා විභක්ති පද වාචෝද්ගත කරමු.

| शब्द | विभक्ति | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|---|
| इदम् | प्रथमा विभक्ति | अयं | इमौ | इमे |
| किम् | प्रथमा विभक्ति | कः | कौ | के |

| अयं | इमौ | इमे |
|---|---|---|
| මෙතෙම | මොවුහු දෙදෙන | මොවුහු |
| कः | कौ | के |
| කවරෙක් ද? | කවර දෙදෙනෙක් ද? | කවරහු ද? |

### පහත සඳහන් වාක්‍ය හඳුනාගනිමු.

| | |
|---|---|
| अयं कः ? | මෙතෙම කවරෙක් ද? |
| अयं अजः | මේ එළුවෙකි. |
| अयं कः ? | මෙතෙම කවරෙක් ද? |
| अयं बालकः | මේ ළමයෙකි. |
| कौ इमौ ? | මොවුහු දෙදෙන කවර දෙදෙනෙක් ද? |
| इमौ बालकौ | මොවුහු දෙදෙන ළමයි දෙදෙනෙකි. |

कौ इमौ ? මොවුහු දෙදෙන කවර දෙදෙනෙක් ද?

इमौ गजौ මොවුහු ඇත්තු දෙදෙනෙකි.

के इमे ? මොවුහු කවරහු ද?

इमे वृषभाः මොවුහු ගොන්නු ය.

के इमे ? මොවුහු කවරහු ද?

इमे अश्वाः මොවුහු අශ්වයෝ ය.

## පහත සඳහන් වාක්‍ය හඳුනාගනිමු.

❖ **इदम्** පුරුෂලිංග ශබ්දයේ ප්‍රථමා විභක්ති ඒකවචන, ද්විවචන, බහුවචන නාමපද වාක්‍යයක තනි ව යෙදුණු විට **अयं** මෙතෙම **इमौ** මොවුහු දෙදෙන **इमे** මොවුහු යනුවෙන් අර්ථ ප්‍රකාශ වෙයි.

अयं खादति । මෙතෙම කයි.

इमौ पठतः । මොවුහු දෙදෙනා පාඩම් කරත්.

इमे क्रीडन्ति । මොවුහු ක්‍රීඩා කරති.

❖ ලිංග, විභක්ති, වචනවලට සමාන ව නාමපදයට විශේෂණ ව **अयं, इमौ, इमे** යෙදුණු විට එම පදවල අර්ථය පොදුවේ ''මේ'' යනුවෙන් ප්‍රකාශ වෙයි.

अयं पुरुषः खादति । මේ මිනිසා කයි.

इमौ छात्रौ पठतः । මේ ශිෂ්‍යයෝ දෙදෙනා පාඩම් කරත්.

इमे बालकाः क्रीडन्ति । මේ ළමයි ක්‍රීඩා කරති.

## 10.1 අභ්‍යාසය

පහත සඳහන් සංස්කෘත වාක්‍ය සිංහලයට නඟමු.

अयं कः ? अयं बुद्धः ।
अयं कः ? अयं बालकः ।

कौ इमौ ? इमौ धनिकौ ।
कौ इमौ ? इमौ गजौ ।

के इमे ? इमे पुत्राः ।
के इमे ? इमे मूर्खाः ।

## 10.2 අභ්‍යාසය

වරහන් තුළ ඇති පහත සඳහන් පද සුදුසු පරිදි යොදා හිස් තැන් පුරවන්න.

(सः/ते/युवां/अहं/तौ/त्वं/वयं/यूयं/आवां/अयं/इमे/इमौ)

1. ................................... तिष्ठति ।
2. ................................... निषीदामि ।
3. ................................... हसतः ।
4. ................................... पुरुषः ।
5. ................................... पश्यामः ।
6. ................................... गच्छन्ति ।
7. ................................... पिबथ ।
8. ................................... गजाः ।
9. ................................... शुनकौ ।
10. ................................... धावति ।
11. ................................... खादथः ।
12. ................................... उपदिशावः